කුඩා දරුවන්ට දන්තාලේප ගිලෙන්නට ඉඩ තබන්න එපා

ඔබේ දරුවාට දත් මැදීම පුරුදු කිරීමේදී ඉතා ස්වල්ප දන්තාලේපන ප්‍රමාණයක් නිකුත් කරන්න. එමෙන්ම දරුවාට පෙනෙන්නට ඔබද ඒ අවස්ථාවේ දත් මදිමින් දන්තාලේපන ඉවත් කරන ආකාරය දරුවාට පෙනෙන්නට

● සුධර්මා සමරසේකර

අභියෝග භාරගන්න සිසුවෙක් අපේ රටේ හැදිලා නෑ, ඒක මුල ඉඳන් අපේ අධ්‍යාපන ක්‍රමය ඇතුළෙත් නෑ

– කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය අධ්‍යයනාංශයේ හිටපු මහාචාර්ය අජන්තා හපුආරච්චි

ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතික තත්ත්වය නිසා අධ්‍යාපනය ලබන දරුවන් ප්‍රචණ්ඩකාරී වීමත්, එම නිසා වඩාත් අභියෝගයට ලක්ව ඇති ගුරු භූමිකාව පිළිබඳවත්, 40 වසරක විශ්වවිද්‍යාල ජීවිතයේ අත්දැකීම් ලද කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය අධ්‍යයනාංශයේ හිටපු මහාචාර්ය අජන්තා හපුආරච්චි සමග සිදුකළ සාකච්ඡාවේ සටහන මෙසේය.

වර්තමානයේ ගුරු භූමිකාව වෙනදාට වඩා අභියෝගයක්ද?

මේක ඉතාම සංකීර්ණ ප්‍රශ්නයක්. ළමයෙක් ඔය තත්ත්වයට පත්වෙන්න පවුල, පාසල, පන්සල, විශ්වවිද්‍යාලය, සමාජය කියන සියලුම ආයතන වග කියන්න ඕනෙ. ...

...දෙන්න පුළුවන් උපරිම සහයෝගය අධ්‍යාපනයට දෙන්න. අධ්‍යාපනය නොලැබීම තමයි සම්පූර්ණ රටක පරිහානියට හේතුව.

විශ්වවිද්‍යාල සිසුන්ගේ අරගලවල ප්‍රචණ්ඩත්වය පිළිබඳ කතා කළොත්?

අරගලවලට යන එකේ මම දකින මූලිකම කාරණාවක් තමයි ඇන්ඩ්‍රජන් කියන හෝමෝන ක්‍රියාකාරිත්වයත් එක්ක මේ ගොල්ලොන්ට ඕන නායකත්වය, කීර්තිය, ආකර්ෂණය ගන්න. අරගලය ඇතුළෙ ජීව විද්‍යාත්මක කාරණාත් තියෙනවා. අරගලය ඇතුළෙ හීනමානයක් තියෙනවා. සමාජ ...

දෙමවුපියන්ට කියන්නේ ඔබේ දරුවා මොන අපහසුතාවක් තිබුණත් ලැබෙන දෙයින් සතුටු වෙන දරුවෙක් හදලා ඒ ළමයාට ...

අරගලවලදී දරුවො දැනගන්න ඕන හරියට අරමුණ හඳුනාගෙන අරමුණට ගමන් කරන්න. අපිට අරමුණක් නැති අරගල තියෙන්නේ. අරගල කරලා ඊළඟට යන්න තියෙන්නේ කොතැනටද කියලා දන්නෙ නැතුව අරගල කරලා වැඩක් නෑ.

වර්තමානයේ නිර්මාණය වෙන්නේ අභියෝග භාරගන්න පරපුරක්ද?

ඔන්න ඔතන තමා ප්‍රශ්නය තියෙන්නේ. හැම රටකම සංවර්ධනයේදී ජාතික දර්ශක වගයක් තියෙනවා. ඒ දර්ශක ඇතුළේ අභියෝග එහෙම නැතිනම් අපි බලාපොරොත්තු නොවන අවදානමක් භාරගැනීම ...



අසාමාන්‍ය වෙන්න බෑ. ගුරුවරු ළමයින්ගෙ ඔළු පලලා තියෙනවා. කන් පලලා තියෙනවා. එහෙම බරපතළ ම්ලේච්ඡ විදියට දරුවන්ට දඬුවම් කරන්න එපා. එතැනදී ගුරුවරයා උසාවියට නෙවෙයි දඬුකඳේ ගහන්න ඕන. ගුරුවරයෙක් සාමාන්‍යයෙන් අවවාදයක් කරලා දරුවෙකුට බොහොම කරුණාවෙන් දරුවාව මෙල්ල කරන ක්‍රමය දැනගන්න ඕන. මම විශ්වවිද්‍යාලයේ අවුරුදු 40ක් හිටියා. මගේ පන්තියේ ළමයි හිටියා යුනියන්වල නායකයන්. කවදාවත් පන්ති කාමරයකට ඇවිත් අපිත් එක්ක වචනයකට වචනයක් කතා කරලා නෑ. ළමයින්ව නරක් කරන්නේ සමාජයේ විවිධ කණ්ඩායම්. ඔවුන්ව ප්‍රයෝජනයට ගන්නවා.

ආණ්ඩුවට බැර කරනවා. රාජ්‍ය නොවන සංවිධාන නඩය තමයි මානව හිමිකම් කියලා ඔක්කොම මානව හිමිකම් ඇතුළට දැම්මේ. ඒ නිසා ගුරුවරයාත් දැනගන්න ඕන ඇත්තටම ළමයින්ට බොහොම ආදරයෙන්, කරුණාවෙන් කතා කරනවා නම් ළමයි කැමතියි. මම උදාහරණයක් කියන්නම්. සමහර වෙලාවට බස්වල යනකොට බහින්න, බහින්න කියලා කෑ ගහලා දගලලා නටලා කියනවාට වඩා පිරිමි ළමයෙකුට අනේ පුතේ ඩිංගක් ඉන්න කියලා කියන්න. ඒ ළමයා 'ඉන්න අම්මා අපි බහිනකල්' කියලා ඉඩ දෙනවා. ඇත්තටම ළමයින්ට කරුණාවෙන් දුවේ, පුතේ කියලා කතා කරනවා නම් ඔය දරුවො ප්‍රචණ්ඩකාරී වීම පොඩි කාලේ ඉඳන් නැවතෙනවා. ඔක්කොම දරුවන්ට සමානව සලකන්න ඕන. අදටත් කොහෙ හරි මගදි දැක්කොත් විශ්වවිද්‍යාල ළමයි අපිට මහපාරක වුණත් වඳිනවා.

...සමලිංගිකත්වය ගැන කතා කරනවා. ඒ කියන කාරණාවලින් එකක් තමයි මානව හිමිකමක් හැටියට 'ළමයින්ට ගහන්න එපා' කියලා ඕක ගෙනත්, ළමයෙක්ට දඬුවම් කළොත් දෙමවුපියන්ට දඬුවම් කරනවා කීවා. ඊටපස්සේ ළමයෙකුට දඬුවම් කළොත්, ගුරුවරයාව දක්කගෙන යනවා උසාවියට. දඬුවම ...

...අද ජීවත් වෙන්න බෑ. අද ඉන්න ළමයින්ට අවශ්‍යතා වැඩියි. ළමයිනුත් සංකීර්ණ වෙලා. ඉතින් මේ සියලු දේ කළමනාකරණය කරගන්න බැලන්ස් තියෙන මනසක් හදාගන්න ඕන. ඒක ආගමෙන් අරගෙන හරි කමක් නෑ. මම විශ්වවිද්‍යාල දරුවන්ට කියන්නේ මොන විදියකින්වත් විශ්වවිද්‍යාල අධ්‍යාපනය නම් කඩාකප්පල් කරගන්න එපා.

දඬුවම අසාමාන්‍ය වෙන්න බෑ. ගුරුවරු ළමයින්ගෙ ඔළු පලලා තියෙනවා. කන් පලලා තියෙනවා. එහෙම බරපතළ ම්ලේච්ඡ විදියට දරුවන්ට දඬුවම් කරන්න එපා. එතැනදී ගුරුවරයා උසාවියට නෙවෙයි දඬුකඳේ ගහන්න ඕන.

වසර 12ක් තිස්සේ අනවසරයෙන් ජනතාවට පීඩාකාරී ලෙසට පවත්වාගෙන යන කුකුළු ගොවිපොළක් මහව නගරයේ

● පොල්පිතිගම - සිසිර කැලේගම

මහව නගරයේ කිසිදු අවසරපතක් නැතිව වසර 12ක් තිස්සේ පවත්වාගෙන යන කුකුල් ගොවිපළකින් නිකුත් වෙන දුර්ගන්ධය හා මැස්සන්ගේ ගැවසීමෙන් සිදුවෙන පීඩාවන් දෙස වගකිව යුතු අංශ නීතිය ක්‍රියාත්මක ...

පැතිරෙන දුර්ගන්ධයෙන් හා මැස්සන්ගෙන් වෙන හානිය සුළුපටු නැහැ
- නගරවාසීන්

අංශවලට භාර දී ඇති නමුත් මෙතෙක් ඒ පිළිබඳ කිසිදු පියවරක් ගෙන නැතැයිද ඔවුහු පැවසූහ.

ප්‍රදේශවාසීන්ට පීඩාකාරී ලෙස අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන මෙම ගොවිපළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය ප්‍රකාරව හා පීඩාකාරී ...

එකී තැනැත්තාව දැනුම්වත් කර ඇතත්, එයටද නිසි පියවරක් ගෙන නොමැත. මේ සියල්ල ලිපිවලට සීමා වීමක් මිස ක්‍රියාවට නැංවෙන ආකාරයක් දක්නට නොලැබීම පුදුම සහගත යැයි ප්‍රදේශවාසීහු එකී ලිපි පෙන්වා දෙමින් කරුණු අනාවරණය කළහ.

එමෙන්ම කුඩා භූමි භාගයක මහා ...

...දහයියාවලින් නිකුත් වෙන දූවිල්ල මහත් පීඩාවක් බව ගම්වැසියෝ චෝදනා කළහ. ඔවුන් ඊට එරෙහිව අවස්ථා කිහිපයකදීම පෙත්සම් අත්සන් කර භාර දිය යුතු ...

මේ ගැන සොයා බලනවා
- මහව ප්‍රා. සභාවේ සභාපති

...බලපත්‍රයක් නොමැතිව මහජන පීඩාවක් වන ලෙසට පවත්වාගෙන යනු ලබන මෙයට නඩු පැවරීමට කටයුතු කරන බවට 2021 වසරේදී ...

...මහව ප්‍රාදේශීය සභාව හා ... ලේකම් කාර්යාලය පවා දැනු... තිබේ. නමුත් එම ලිපිවලට ප... කිසිදු ප්‍රතිචාරයක් දක්නට න...



...ලෙසට මමත්, මගේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුනුත් එම ව්‍යාපාරිකයා දැනුම්වත් කර තිබෙනවා. නමුත් ...

- වතුපිටිවල මූලික ... ශල්‍ය වෛද්‍ය චන්දන ... මහතාගෙනි.



ඉන්දියාව තුළ අලෙවි කරන රන් ආභරණ සඳහා ඉලක්කම් හයක කේතයක් අනිවාර්ය කෙරේ

● වඩාත් ගුණාත්මක බවින් ඉහළ රත්රන් ආභරණ පාරිභෝගිකයා වෙත ලබාදීම අරමුණු කර අප්‍රේල් 01දා සිට ක්‍රියාත්මකයි



මෙම ක්‍රමවේදය හරහා රන් ආභරණවල ගුණාත්මකබව පිළිබඳව සුරක්ෂිතභාවයක් හිමිවෙනවා. එය වඩාත් ගුණාත්මක රන් ආභරණයක් මිලදී ගැනීමට බලාපොරොත්තු වන පාරිභෝගිකයන්ට හොඳ අවස්ථාවක් බව පැවසිය යුතුයි." ඉන්දීය පාරිභෝගික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අතිරේක ලේකම්වරියක වන නිධි ඛාරේ පවසයි.

...(මෙම සටහන් 2021 ... ආභරණයක් වෙත ...) තෙවැන්න වන්නේ ...ත්වාදී ඇති HUID ...කුරු හයකින් යුත් ...

...ගුණාත්මක රන් ආභරණයක් මිලදී ගැනීමට බලාපොරොත්තු වන පාරිභෝගිකයන්ට හොඳ අවස්ථාවක් බවත් පවසා සිටියි.

මෙහිදී එම රන් ආභරණ සහ රනින් නිම වූ කලාකෘති වෙත අදාළ HUID අංකය ලබාදීම Assaying " Hallmarking Centre මගින් සිදු කරයි. ඒ අනුව මෙම රන් භාණ්ඩ පරීක්ෂා කිරීමේ පහසුකම් රට තුළ ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පිළිබඳවද රජය බලධාරීන් දැනුවත් කර තිබේ.

අතීතයේ සිට මෙන්ම වර්තමානයේදී ඉන්දියාව රන් සඳහා ලොව විශාලතම වෙළෙඳ පොළක් ලෙස හඳුනාගෙන ඇති අතර, ඉදිරියේදීද එරට තුළ රන් සඳහා වන ඉල්ලුම ඉහළ යාමේ අවස්ථාවක් පවතී.

ලෝක රන් කවුන්සිලයේ දත්ත අනුව 2022 දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වූ කාර්තුවේදී ඉන්දියාව තුළ රන් සඳහා වන ඉල්ලුම ටොන් 276.1ක් ලෙස අඩු වී තිබේ. එය පෙර වසරේ එම කාර්තුව සාපේක්ෂව 20%ක අඩුවීමකි. මේ සමග පසුගිය වසරේ ඉන්දියාවේ රන් පරිභෝජනය ටොන් 77ක් දක්වා පහත වැටී ඇත. එහිදී මූලිකවම ගෝලීය ආර්ථික අවපාතය මෙන්ම, ඉන්දියාවේ උද්ධමනය හේතු වී තිබේ.

කෙසේ වෙතත්, 2023 මාර්තු 31 වැනිදායින් අවසන් වන 2023 පළමු වැනි කාර්තුව වනවිට ඉන්දියාවේ රන් පරිභෝජනය යළිත් පෙර පැවැති ...

අයාලේ යන සුනඛයන් වෙනුවෙන් පිළිසරණක් වූ විදෙස් තරුණියෝ



අසරණ සුනඛයන් දැක එම අසරණ සතුන් වෙනුවෙන් කිසියම් සේවයක් සිදුකිරීමේ අරමුණින් 2019 වසරේදී මෙය ඇල්ල නගරයෙන් ආරම්භ කළ බව ජොයෙල් පැවසුවාය.

විදේශ රටවල තිබෙන මෙවැනි සතුන් රැකබලා ගන්නා සංවිධාන සහ පුද්ගලයන් හඳුනාගෙන ඔවුන් ...

එක්සත් රාජධානියේ පදිංචි අලී මෙසේ කීවාය.

"අද මහ මග බල්ලෝ පැටවුන් දාලා එම සත්තු, කුඩා පැටවුන් අසරණ වී සිටිනවා. එම සතුන් ගැන බලන්න කවුරුත් නෑ. සල්ලිකාර පොහොසත් උදවිය ලක්ෂ ගණන් වැය කර සුනඛයන් ඇතිකරනවා. නමුත් පාරේ ඉන්න සතුන් දිහා කවුරුත් බලන්නේ නෑ. අපි දැක්කා සමහර බල්ලෝ මිනිස්සුන්ව, කුඩා දරුවන් සපා කනවා. මේ මහමග අයාලේ යන සුනඛයන්ගෙන් මේ වගේ තර්ජන ගොඩක් ලංකාවේ ජනතාවට තිබෙනවා. අපි මේ අයාලේ යන සුනඛයන් ...

එක්සත් රාජධානියේ පදිංචි අලී